කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
வளிமண்டலவியல் திணைக்களம்
**Department of Meteorology**

TP : 011 2686686
Fax : 011 2691443
E-mail : metnmc@gmail.com
Web : www.meteo.gov.lk

ශ්‍රී ලංකාව සඳහා සාමාන්‍යය කාලගුණ අනාවැකිය

# GENERAL WEATHER FORECAST FOR SRI LANKA

ජාතික කාලගුණ විද්‍යා මධ්‍යස්ථානයේ, අනාවැකි අංශය මගින් නිකුත් කරන ලදි.
Issued by Forecasting Division, National Meteorological Centre.

---

## 2020 නොවැම්බර් මස 25 දින සඳහා කාලගුණ අනාවැකිය
## 2020 නොවැම්බර් මස 24 දින මධ්‍යහන 12.00 ට නිකුත් කරන ලදි.

**නිරිත දිග බෙංගාල බොක්ක මුහුදු ප්‍රදේශයේ පවතින "නිවාර්" සුළි කුණාටුව අද (24) උදෑසන 8.30 වන විට ලංකාවේ කන්කසන්තුරය වෙරළට කි.මී. 325 ක් නැගෙනහිරින් (10.0N, 83.0E) ස්ථානගතව පැවතුනි. එය ඉදිරි පැය 36ක කාලය තුළ චන්ඩ සුළි කුණාටුවක් දක්වා වර්ධනය වෙමින් දිවයිනේ උතුරු වෙරළ ආසන්නයෙන් ඉන්දියාවේ තමිල්නාඩු වෙරළ දෙසට ගමන් කරනු ඇතැයි අපේක්ෂා කෙරේ.**
මෙම පද්ධතියේ බලපෑම හේතුවෙන් දිවයිනේ නැගෙනහිර, උතුරු සහ උතුරු මැද පළාත්වල විටින් විට පැ.කි.මි. (60-70) පමණ දක්වා වන ඉතා තද ප්‍රහාරාත්මක සුළං ඇති විය හැක. සෙසු ප්‍රදේශවල පැ.කි.මි.(40-50) පමණ දක්වා වන ප්‍රහාරාත්මක තද සුළං ඇති විය හැක.

උතුරු, උතුරු-මැද, වයඹ සහ බස්නාහිර පළාත්වල අහස වලාකුළු වලින් බරව පවතිනු ඇත.

උතුරු සහ උතුරු මැද පළාත්වලත් පුත්තලම දිස්ත්‍රික්කයේත් විටින් විට වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇතිවන අතර ඇතැම් ප්‍රදේශවලට මි.මී. 75 ට වැඩි තද වැසි ඇතිවිය හැක.

බස්නාහිර සහ සබරගමුව පළාත්වල තැනින් තැන වැසි ඇතිවේ.
ඌව පළාතේ ස්ථාන ස්වල්පයක සවස 2.00 න් පසුව වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇතිවිය හැක.

**තද සුළං මගින් සිදු විය හැකි අනතුරු අවම කර ගැනීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස ජනතාවගෙන් කාරුණිකව ඉල්ලා සිටිනු ලැබේ.**

## WEATHER FORECAST FOR 25th NOVEMBER 2020
## Issued at 12.00 noon on 24rd November 2020

**The Cyclonic Storm "NIVAR" over southwest Bay of Bengal is located near (10.0N, 83.E) at 0830hrs today (24), 325km to the east of Kankasanthurai coast. It is very likely to intensify into a Severe Cyclonic Storm and expected to move northwestwards and cross Tamil-Nadu coast, India, during next 36 hours.**
Under the influence of this system, very strong gusty winds (60-70)kmph can be expected in Northern, Eastern and North-Central provinces. Strong gusty winds (40-50)kmph can be expected elsewhere.
Cloudy skies can be expected over Northern, North-Central, North-Western and Western provinces.

Showers or thundershowers will occur at times in Northern and North-Central provinces and Puttalam district. Heavy falls above 75mm are likely at some places.

Showers will occur at several places in Western and Sabaragamuwa provinces.
Showers or thundershowers may occur at a few places in Uva province after 2.00 p.m.

**General public is kindly requested to take adequate precautions to minimize damages caused by strong winds.**

Rainfall amount (mm): Light: 00-12.50, Light to moderate: 12.50-25, moderate: 25-50, Fairly Heavy rain: 50 -100, Heavy rain: 100 – 150, Very heavy rain: 150 or more.

වර්ෂාපතනය(මි.මී) : සිහින් වැසි: 00-12.50, සිහින් හෝ මද වැසි: 12.50-25, මද වැසි: 25-50, තරමක් තද වැසි: 50 -100, තද වැසි:100 – 150, ඉතා තද වැසි: 150 හෝ ඊට වැඩි

කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
வளிமண்டலவியல் திணைக்களம்
Department of Meteorology

TP : 011 2686686
Fax : 011 2691443
E-mail : metnmc@gmail.com
Web : www.meteo.gov.lk

දිවයින වටා මුහුදේ කාලගුණය සහ ස්වභාවය
## WEATHER AND STATE OF SEA AROUND THE ISLAND
ජාතික කාලගුණ විද්‍යා මධ්‍යස්ථානයේ, අනාවැකි අංශය මගින් නිකුත් කරන ලදි
Issued by Forecasting Division, National Meteorological Centre

ඉදිරි පැය 24 ට දිවයින වටා වන මුහුදු ප්‍රදේශ සඳහා කාලගුණ අනාවැකිය
2020 නොවැම්බර් මස 24 දින මධ්‍යහන 12.00 ට නිකුත් කරන ලදි.

**විශේෂ නිවේදනය**

නිරිත දිග බෙංගාල බොක්ක මුහුදු ප්‍රදේශයේ පවතින “නිවාර්” සුළි කුණාටුව අද (24) උදෑසන 8.30 වන විට ලංකාවේ කන්කසන්තුරය වෙරළට කි.මී. 325 ක් නැගෙනහිරින් (10.0N, 83.0E) ස්ථානගතව පැවතුනි. එය ඉදිරි පැය 36ක කාලය තුළ චන්ඩ සුළි කුණාටුවක් දක්වා වර්ධනය වෙමින් දිවයිනේ උතුරු වෙරළ ආසන්නයෙන් ඉන්දියාවේ තමිල්නාඩු වෙරළ දෙසට ගමන් කරනු ඇතැයි අපේක්ෂා කෙරේ.
එබැවින් 07N-13N සහ 80E-90E අතර මුහුදු ප්‍රදේශවල නිරන්තර වැසි, තද හෝ ඉතා තද ප්‍රහාරාත්මක සුළං සහ රළු හෝ ඉතා රළු මුහුදු ප්‍රදේශ ඇතිවිය හැක.

**වැසි තත්ත්වය:**

පුත්තලම සිට මන්නාරම, කන්කසන්තුරය, ත්‍රිකුණාමලය සහ මඩකලපුව හරහා පොතුවිල් දක්වා වන මුහුදු ප්‍රදේශවල නිරන්තර වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇති වේ.

**සුළඟ:**

පුත්තලම සිට මන්නාරම, කන්කසන්තුරය, ත්‍රිකුණාමලය සහ මඩකලපුව හරහා පොතුවිල් දක්වා වන මුහුදු ප්‍රදේශවල සුළං උතුර සිට වයඹ දක්වා දිශාවලින් හමන අතර සුළගේ වේගය විටින් විට පැ.කි.මී. (80-100) දක්වා ඉහළ යාමට හැකියාවක් පවතී. සෙසු මුහුදු ප්‍රදේශවල සුළං වයඹ සිට නිරිත දක්වා දිශාවලින් හමයි. පුත්තලම සිට කොළඹ හරහා හම්බන්තොට දක්වා වන මුහුදු ප්‍රදේශවල සුළගේ වේගය විටින් විට පැ.කි.මී. (50-60) දක්වා ඉහළ යාමට හැකියාවක් පවතී. සෙසු මුහුදු ප්‍රදේශවල සුළගේ වේගය පැ.කි.මී. 30-40 පමණ වේ.

**මුහුදේ ස්වභාවය:**

පුත්තලම සිට මන්නාරම, කන්කසන්තුරය, ත්‍රිකුණාමලය සහ මඩකලපුව හරහා පොතුවිල් දක්වා වන මුහුදු ප්‍රදේශ විටින් විට ඉතා රළු හෝ දළ රළු විය හැකි බැවින් මෙම මුහුදු ප්‍රදේශවල ධීවර සහ නාවුක කටයුතුවලින් වැළකී සිටින ලෙස දැනුම් දෙනු ලැබේ.
පුත්තලම සිට කොළඹ හරහා හම්බන්තොට දක්වා වන මුහුදු ප්‍රදේශ විටින් විට තරමක් රළු විය හැකි බැවින් මෙම මුහුදු ප්‍රදේශවල ධීවර සහ නාවුක කටයුතුවල යෙදීමේදී වඩාත් අවදානයෙන් පසුවිය යුතු බව දැනුම් දෙනු ලැබේ.

Rainfall amount (mm): Light: 00-12.50, Light to moderate: 12.50-25, moderate: 25-50, Fairly Heavy rain: 50 -100, Heavy rain: 100 – 150, Very heavy rain: 150 or more.

වර්ෂාපතනය(මි.මී) : සිහින් වැසි: 00-12.50, සිහින් හෝ මද වැසි: 12.50-25, මද වැසි: 25-50, තරමක් තද වැසි: 50 -100, තද වැසි:100 – 150, ඉතා තද වැසි: 150 හෝ ඊට වැඩි

කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
வளிமண்டலவியல் திணைக்களம்
Department of Meteorology
TP : 011 2686686
Fax : 011 2691443
E-mail : metnmc@gmail.com
Web : www.meteo.gov.lk

## WEATHER FORECAST FOR SEA AREAS AROUND THE ISLAND DURING NEXT 24 HOURS
**Issued at 12.00 noon on 24 November 2020**

**Special Notice**

**The Cyclonic Storm "NIVAR" over southwest Bay of Bengal is located near (10.0N, 83.E) at 0830hrs today (24), 325km to the east of Kankasanthurai coast. It is very likely to intensify into a Severe Cyclonic Storm and expected to move northwestwards and cross Tamil-Nadu coast, India, during next 36 hours.**
**As such, intemittent showers/thundershowers, strong or very strong gusty winds and rough or very rough seas can be expected in the sea areas in between 07N-13N, 80E-90E during next few days.**

**Condition of Rain:**

Intemittent showers or thundershowers will occur in the sea areas extending from Puttalam to Pottuvill via Mannar, Kankasanthurai, Trincomalee and Batticaloa.

**Winds:**

Winds will be northerly to north-westerly and wind speed can increase up to **(80-100) kmph** at times over sea area extending from Puttalam to pottuvil via Mannar, Kankasanthurai, Trincomalee and Batticaloa. Winds will be north-westerly to south-westerly in the other sea areas around the island.
Wind speed can increase up to **(50-60) kmph** at times over sea area extending from Puttalam to Hambanthota via Colombo. Wind speed will be 30-40 kmph in other sea areas.

**State of Sea:**

The sea areas extending from Puttalam to Pottuvil via Mannar, Kankasanthurai, Trincomalee and Batticaloa will be very rough or high at times. Naval and fishing communities are advised not to venture these sea areas.
The sea areas extending from Puttalam to Hambanthota via Colombo will be fairly rough at times. Naval and fishing communities are request to be vigilant in this regard.

Rainfall amount (mm): Light: 00-12.50, Light to moderate: 12.50-25, moderate: 25-50, Fairly Heavy rain: 50 -100, Heavy rain: 100 – 150, Very heavy rain: 150 or more.

වර්ෂාපතනය(මි.මී) : සිහින් වැසි: 00-12.50, සිහින් හෝ මද වැසි: 12.50-25, මද වැසි: 25-50, තරමක් තද වැසි: 50 -100, තද වැසි:100 – 150, ඉතා තද වැසි: 150 හෝ ඊට වැඩි